**මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව**

**2025/2026**

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**අයදුම්කරුවන් සඳහා මූලික තොරතුරු සහ පොදු උපදෙස්**

(01) මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට 2025 ජනවාරි 31 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාඨමාලා සමායෝජක, මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව, දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් බාරදිය යුතුය.

(02) පාඨමාලා ගාස්තු සහ අනෙකුත් ගාස්තු

පාඨමාලා ගාස්තුව - රු 67000.00 (රු 66000.00 + ලියාපදිංචි ගාස්තු - රු 1000.00)

(මෙම ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. මුල් වාරිකය වන රු. 45000.00 මුදල ලියාපදිංචි වීමේදී ගෙවිය යුතුය. ඉතුරු මුදල තවත් මාස දෙකක් ඇතුලත ගෙවා නිම කළ හැකිය.)

අයදුම්පත් ගාස්තු - රු 500.00 (මෙම ගාස්තුව ඕනෑම මහජන බැංකු ශාඛාවකින් **013010001777** ගිණුමට ගෙවා එම රිසිට්පත අයදුම්පත සමග අනිවාර්යයෙන් එවිය යුතුය.)

සටහන: සියලුම ගෙවීම් සාමාන්‍ය තැන්පතු ලෙස සිදු කළ යුතු අතර ගෙවීම්පතෙහි කහ පිටපත පාඨමාලා සමායෝජක වෙත ලබා දිය යුතුය.

(03) සුදුසුකම්

- අ.පො.ස. උසස් පෙළ විෂයයන් තුනකින් (03) එකවර සමත් වී තිබීම
  හෝ

- අ.පො.ස. උසස් පෙළ විෂයයන් දෙකකින් (02) එකවර සමත් වී තිබීම හා වසර දෙකක හෝ ඊට වැඩි වෘත්තීය පළපුරුද්ද
  හෝ
- පිළිගත් ආයතනයකින් NVQ 4 මට්ටමේ (උසස් සහතික පත්‍ර) පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම

❖ මෙවර අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අපේක්ෂකයන්ටද ඉල්ලුම් කළ හැකිය. ප්‍රතිඵල නිකුත් කළ පසු ප්‍රතිඵල පත්‍රය **පාඨමාලා සමායෝජක වෙත භාර දිය යුතුය.** නිකුත් වූ ප්‍රතිඵල ඉහත සුදුසුකම් සපුරන්නේ නම් අපේක්ෂකයාට ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කළ හැක. එසේ නොමැති නම් අපේක්ෂකයාට පාඨමාලාව මාස හයක (06) සහතික පත්‍ර පාඨමාලාවක් ලෙස අවසන් කළ හැක.
සහතික පත්‍ර පාඨමාලාවේ විස්තර පහත පරිදි වේ.
  - කාලය - මාස 06
  - පාඨමාලා ගාස්තුව - රුපියල් 45000.00

(04) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකයේ පිටපත
2. ජාතික හැඳුනුම්පතේ පිටපත
3. **උසස් පෙළ** හෝ නියමිත සහතික පිටපත්

   (මෙවර අ.පො.ස. උසස් පෙළ පෙනී සිටි අපේක්ෂකයන් තමන් උසස් පෙළ විභාගයට පෙනී සිටි බවට පාසලේ විදුහල්පති විසින් සනාථ කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.)
4. පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප දෙකක්

(05) සම්මුඛ පරීක්ෂණයෙන් පසු ඔබව පාඨමාලාවට තෝරාගනු ලැබුව හොත් ඒ බව ඔබට ලිඛිතව දැනුම් දෙන අතර පාඨමාලා ගාස්තු ඉන් අනතුරුව ගෙවිය යුතුය.

(06) පාඨමාලාව ඉරිදා දිනවලදී පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වා පැවැත්වෙන අතර මාර්ගගතව හා විශ්වවිද්‍යාලය තුළදී දේශන පැවැත්වේ. ඒ පිළිබඳ සියලු තීරණ පාඨමාලා සමායෝජක විසින් ක්‍රියාත්මක කරන අතර අපේක්ෂකයන් එම තීරණවලට එකඟ වියයුතුය.

(07) පාඨමාලාව වසරක කාලයක් පැවැත්වෙන අතර සමාසික දෙකක් ලෙස එය කොටස් කරනු ලැබේ.

| පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|
| DPSY 1110 - සාමාන්‍ය මනෝවිද්‍යාව | DPSY 1210 - උපදේශන මනෝවිද්‍යාව හැඳින්වීම |
| DPSY 1120 - ළමා මනෝවිද්‍යාව | DPSY 1220 - සමාජ මනෝවිද්‍යාව |
| DPSY 1130 - අසාමාන්‍ය මනෝවිද්‍යාව | DPSY 1230 - කාර්මික මනෝවිද්‍යාව |
| DPSY 1140 - පෞරුෂ මනෝවිද්‍යාව | DPSY 1240 - ප්‍රජානන මනෝවිද්‍යාව |
| DPSY 1150 - අධ්‍යාපන මනෝවිද්‍යාව | DPSY 1250-පර්යේෂණ ක්‍රමවේදය හා පර්යේෂණ වාර්තාව |

(08) සියලු දේශන පවත්වනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය හා සුදුසුකම් ලත් බාහිර සම්පත්දායකයන් විසිනි.

(09) පාඨමාලාව උදෙසා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා යන වියදම් හෝ ගාස්තු පාඨමාලා ගාස්තුවට ඇතුළත් නොවේ.

(10) පාඨමාලාවට සම්බන්ධ වන සියලු දෙනා විශ්වවිද්‍යාලයීය විභාග නීති සහ අනෙකුත් නීති පිළිගත යුතු අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ඩිප්ලෝමා අපේක්ෂකයෙකු ලෙස විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය රැකෙන අයුරින් කටයුතු කළ යුතුය.

ආචාර්ය නෙල්ලිවල මෙත්තානන්ද හිමි
පාඨමාලා සමායෝජක
මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව
දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2023/12/01

නියෝජ්‍ය ලේඛකාධිකාරි
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය